රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2008

මගේ අංකය:- ආ/7/3/2/23-1
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ-07.

2008.06.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම

ඉහත කරුණට අදාලව නිකුත් කර ඇති 2006 ජුලි 14 දිනැති අංක 11/2006 හා 2008.03.26 දිනැති අංක 11/2006(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අවලංගු කරන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන විධිවිධාන 2008.06.01 දින සිට ක්‍රියාත්මකවේ.

02. අනුයුක්ත කල නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට පහත සඳහන් පරිදි මාසික ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.

| නිලධාරී කාණ්ඩය | මාසික දීමනාව | |
|---|---|---|
| | පෙට්‍රල් | ඩීසල් |
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධාරීන් | රු. 20000/- | රු. 14000/- |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධාරීන් | රු. 18000/- | රු. 12000/- |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධාරීන් | රු. 15000/- | රු. 10000/- |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | රු. 12500/- | රු. 8000/- |

03. අනුයුක්ත කල නිලවාහන හිමිකම් ඇති නිලධාරීන්ගේ පෞද්ගලික ගමන් වෙනුවෙන් රියදුරන්ට අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා ගෙවීම රජයේ වැය බරක් නොවිය යුතුය. එම වැය බර අදල නිලධාරියා විසින් දැරිය යුතුය. රාජකාරිමය ගමන් සඳහා වන අතිකාල හා සංයුක්ත දීමනා රජය මගින් ගෙවනු ලබන අතර ඒ සඳහා ඇමුණුම 01 හි සඳහන් ආකෘතිය භාවිතා කල යුතුය.

04. අනුයුක්ත කල නිලවාහන හිමිකම් ඇති නිලධාරීන් තමන්ගේ රාජකාරි ගමන් සඳහා සංචිත වාහන භාවිතා නොකල යුතුය. එමෙන්ම ඉහත 02 ජේදයේ සඳහන් කර ඇති මූල්‍යමය සීමාවන් තුල සියළුම නිලධාරීන් සිය රාජකාරි අවශ්‍යතා සපුරා ගත යුතු අතර අතිරේක ඉන්ධන ප්‍රතිපාදන

නොඉල්ලිය යුතුය. තවද සේවා ස්ථානයෙන් බැහැර ප්‍රදේශයන්හි රාජකාරි සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු සහභාගි වන අවස්ථාවන්හිදී කණ්ඩායමක් වශයෙන් ප්‍රවාහන පහසුකම් සලසා දිය යුතුය. එවැනි අවස්ථාවන්හිදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ/ පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ඇතිව අතිරේක ඉන්ධන ප්‍රතිපාදන ලබාගත හැක. එක් එක් නිලධාරියා වෙනුවෙන් එසේ අනුමත කර ඇති අතිරේක ඉන්ධන ප්‍රමාණය දක්වන ලේඛණයක් අදාල ආයතනය විසින් පවත්වා ගත යුතුය.

05. ඉන්ධන දීමනා සඳහා හිමිකම් ඇත්තාවූ තනතුරු එකකට වැඩි සංඛ්‍යාවක සේවයේ නියුක්ත නිලධාරියකු තම නිත්‍ය තනතුරට හිමි ඉන්ධන දීමනාව පමණක් ලබනු ඇත. එසේ වුවත් අතිරේකව දරනු ලබන තනතුරට අදාලව සේවා ස්ථානයෙන් බැහැරව යෙදෙන විශේෂ රාජකාරි ගමන් සඳහා එකී තනතුරට හිමි ඉන්ධන සීමාවට යටත්ව අතිරේක ඉන්ධන අදාල අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය යටතේ ලබාගත හැකිය.

06. නිලධාරියකු විශ්‍රාම පූර්ව නිවාඩු ලබා සිටින කාලය තුළ හෝ මසකට වැඩි කාලයක් දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී හෝ නිල වාහන භාවිතා කිරීමට හෝ රියදුරුගේ සේවය ලබා ගැනීමට හෝ හිමිකම නැත. එසේ වුවද අසනීප වැනි නිලධාරියාගේ පාලනයෙන් බැහැර හේතුවක් මත වැටුප් රහිත නිවාඩු ලබාගන්නා අවස්ථාවකදී මෙම විධිවිධාන මසකට වැඩි කාලයක් සඳහා සංශෝධනය කිරීමේ බලය ආයතන අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

07. කණ්ඩායම් ප්‍රවාහනයට ආයතන විසින් යොද ඇති වාහනවල යාමඒම සඳහා උපරිම ගමන් දුර කාර්යාලයේ සිට කි.මී. 50 කට සීමා විය යුතුය.

08. රජයේ වාහන මනා පාලනය හා නඩත්තු වෙනුවෙන් හඳුන්වා දී ඇති සියළුම නීති රෙගුලාසි සහ පරිපාටින් තවදුරටත් ඒ ආකාරයෙන්ම අනුගමනය කළ යුතුය.

09. රාජ්‍ය බැංකු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්ද ඉහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු අතර එම ආයතනවල වාහන අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ ඉන්ධන දීමනාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

10. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකගතාවය මතය.

ඩී. දිසානායක<br>
ලේකම්<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 1

අංක ........................................... මෝටර් රථය

200 ................................ මාසය වෙනුවෙන් දෛනික සටහන

...................................................අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / සංස්ථාව

1. පාවිච්චි කරන නිලධාරියාගේ නම :- ..................................................................
2. තනතුර :- ..................................................................
3. රියදුරුගේ නම :- ..................................................................
4. ඩීසල / පැට්‍රල් වාහනයක් ද යන වග :- ..................................................................
5. මාසය ආරම්භක දිනයේ මීටරයේ අංකය :- ..................................................................
6. මාසය අවසානයේ මීටරයේ අංකය :- ..................................................................

| | මාසය / දින | ආරම්භක වේලාව | අවසාන වේලාව | ධාවනය වූ කි.මී.ගණන | රියදුරුගේ අත්සන (සේවය කළ දින සඳහා පමණයි) | මාණ්ඩලික නිලධාරියාගේ අත්සන |
|---|---|---|---|---|---|---|
| 01. | | | | | | |
| 02. | | | | | | |
| 03. | | | | | | |
| 04. | | | | | | |
| 05. | | | | | | |
| 06. | | | | | | |
| 07. | | | | | | |
| 08. | | | | | | |
| 09. | | | | | | |
| 10. | | | | | | |
| 11. | | | | | | |
| 12. | | | | | | |
| 13. | | | | | | |
| 14. | | | | | | |
| 15. | | | | | | |
| 16. | | | | | | |
| 17. | | | | | | |
| 18. | | | | | | |
| 19. | | | | | | |
| 20. | | | | | | |
| 21. | | | | | | |
| 22. | | | | | | |
| 23. | | | | | | |
| 24. | | | | | | |
| 25. | | | | | | |
| 26. | | | | | | |
| 27. | | | | | | |
| 28. | | | | | | |
| 29. | | | | | | |
| 30. | | | | | | |
| 31. | | | | | | |